(6)

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

நலன்புரி நன்மைகள் சபை

WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

Ministry of Finance, Economic Stabilaization & National Policies

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.


මගේ අංකය / எனது இல / My No. } WBB/General/2022 — ඔබේ අංකය / உமது இல / Your No } — දිනය / திகதி / Date } 2022. 08. 23

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>සුබසාධක සහනාධාර ප්‍රතිලාභ ගෙවීම් ලැබීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනාගැනීම-2022</u>**

2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ විධිවිධාන අනුව සියලු සුබසාධක සහනාධාර ප්‍රතිලාභ ගෙවීම පිණිස සුදුසු තැනැත්තන් හඳුනා ගැනීම සඳහා නව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර තිබේ.

ඒ අනුව සුබසාධක ප්‍රතිලාභ පනතේ 8(1) වගන්තිය ප්‍රකාරව ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ බලතල,කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා ඔබට බලතල පවරා තිබේ.

ඉලක්කගත ප්‍රජාව නිවැරදිව හඳුනා ගත් සමාජ සුබසාධක දත්ත පද්ධතියක අවශ්‍යතාවය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි මෙරටට ආධාර සපයන පාර්ශවකරුවන් අවධාරණය කොට ඇති අතර එම අවශ්‍යතාවය කඩිනමින් සම්පූර්ණ කිරීමට රජයේ ප්‍රමුඛ අවධානය යොමුවී ඇත.

මාගේ අංක WBB/General/2022 හා 2022.07.29 දිනැති ලිපියට ප්‍රතිචාර වශයෙන් ඔබෙන් ලද තොරතුරු ද සැලකිල්ලට ගෙන ඔබගේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් සේවය කරන නිලධාරීන්ගේ පෞද්ගලික ජංගම දුරකථනය (Smart Phone 3G) යොදා ගනිමින් මෙම දත්ත රැස්කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව ඔබේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ පෞද්ගලික ජංගම දුරකථන ඒ සඳහා යොදා ගැනීමටත් එම නිලධාරීන් ප්‍රමාණය අපේක්ෂිත ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාවට අනුව කෙටිකාල සීමාවකින් අවසන් කර ගැනීම සඳහා අවශ්‍ය සහය ලබාදෙන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙම වැඩසටහන අදියර දෙකකින් ක්‍රියාත්මක වේ.පළමු අදියර සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනාගැනීම හා තේරීම වන අතර දෙවැනි අදියර තේරීම් වලින් අනතුරුව ප්‍රකාශයට පත්කෙරෙන නාම ලේඛනයන් හි යම් පුද්ගලයෙකුගේ නම ඇතුලත් නොවීම හේතු කොටගෙන ඉදිරිපත් කෙරෙන අභියාචනා හා නුසුදුසු තැනැත්තන් තවදුරටත් එම ලේඛනයේ ඇතුලත් වීමට එරෙහිව ඉදිරිපත් කෙරෙන විරෝධතා පරීක්ෂණ සිදුකර අවසන් ලේඛනය සකස් කිරීමවේ.මීට අදාලව කටයුතු කිරීම සඳහා මාර්ගෝපදේශයන් පසුව ඉදිරිපත් කරනු ලැබේ.

සුබසාධක ප්‍රතිලාභ ගෙවීම ලැබීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනාගැනීමේදී ජංගම දුරකථන මාර්ගයෙන් අපේක්ෂිත තොරතුරු ලබාගැනීමට අවශ්‍ය සියලු කටයුතු සූදානම් කර ඇත.එම තොරතුරු ලබා ගැනීමේදී අදාල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ලැබී ඇති ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාවට සාපේක්ෂව සුදුසු ක්ෂේත්‍ර නිලධාරීන් සංඛ්‍යාවක් පත් කිරීමට ඔබට බලය පවරමි.


කාර්යාලය / அலுவலகம் / Office } Tel: 009411- 2151481, 009411- 2484600/4117, Fax: 009411- 2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail } welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website } www.wbb.gov.lk

සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම් සඳහා සුදුසු තැනැත්තන්ගේ තේරීම පියවර කිහිපයකින් සමන්විත වේ.එනම්,

පළමු පියවර-

1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සුබසාධක ප්‍රතිලාභ තොරතුරු පද්ධතිය සමඟ කටයුතු කිරීමට අනුයුක්ත කරන ලද සුබසාධක ප්‍රතිලාභ තොරතුරු නිලධාරීන් (WBIO)දත්ත පද්ධතියේ ලියාපදිංචි කිරීම. (සුබසාධක ප්‍රතිලාභ තොරතුරු නිලධාරීන් පද්ධතිය වෙත ලියාපදිංචි වීමේ ක්‍රමවේදය ඇමුණුම හි දක්වා ඇත.අනුයුක්ත කරන ලද නිලධාරීන්ගේ යම් වෙනසක් සිදුව ඇත්නම් එම තොරතුරු කඩිනමින් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත දැනුම් දිය යුතුය.)

2. දත්ත එක් රැස් කිරීමට ක්ෂේත්‍රයට (ග්‍රාමීය වසම් මට්ටමට)යන නිලධාරීන් (තේරීම් කමිටු/Enumerators) තොරතුරු පද්ධතියේ ලියාපදිංචි කිරීම. ( මෙම නිලධාරීන්ගේ ලියාපදිංචි වීම ඔබ විසින් පරිගණක පද්ධතිය හරහා තහවුරු කළ යුතුය.මෙම ක්‍රියාවලිය පරිගණක පද්ධතිය ඇසුරෙන් කරන ආකාරය ඇමුණුම හි දක්වා ඇත.)

දෙවන පියවර -

1. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සුබසාධක සහනාධාර ප්‍රතිලාභ ගෙවීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනා ගැනීමට අයදුම්පත් කැඳවීමට අදාල ප්‍රසිද්ධ නිවේදනය ඉදිරියේදී ජාතික පුවත්පත් වල පල කරනු ලැබේ.

2. අයදුම්කරුවන් විසින් ඔබ වෙත ඉදිරිපත් කරන අයදුම්පත් වල ඇති තොරතුරු සුබසාධක ප්‍රතිලාභ තොරතුරු ඒකකයට අනුයුක්ත කර ඇති නිලධාරීන් විසින් ඒ සඳහා ලබා දී ඇති යොමුව හරහා පරිගණක ගත කලයුතුය. මෙසේ අයදුම්කරුවන්ගේ මූලික තොරතුරු ඇතුළත් අයදුම්පත පද්ධතිගත කල පසු QR කේත සහිත අයදුම්කරුවන්ගේ නාම ලේඛනයක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සකස් වේ.

තුන්වන පියවර-

අයදුම්කරුවන්ගේ ගෘහ ඒකක වෙත ගොස් පද්ධතිය මගින් ලබා දුන් QR කේත සහිත ලැයිස්තුව පදනම් කරගෙන සපයා ඇති ජංගම දුරකථන යෙදවුම(Mobile App) භාවිතා කරමින් බලයලත් නම් කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන් විසින් දත්ත එක්රැස් කිරීම තුන්වන පියවරයි.ක්ෂේත්‍ර නිලධාරීන් ගෘහ ඒකක වෙත ගොස් අයදුම්කරුවන්ගේ වැඩිදුර තොරතුරු එක්රැස් කිරීම අවසන් වූ පසු නිලධාරියා විසින් අයදුම්කරුට QR කේතය ඇතුළත් තොරතුරු ලබා ගැනීම සහතික කරන ලද පත්‍රිකාවක් ලබාදෙන අතර අයදුම්කරු විසින් ලබාදුන් තොරතුරු වල නිවැරදිතාවය තහවුරු කර QR කේත ඇතුළත් පත්‍රිකාවට අත්සන් තැබිය යුතුය.අවසාන වශයෙන් ක්ෂේත්‍ර නිලධාරියා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත දත්ත පද්ධතියට ඇතුළත් කල යුතුය.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙලෙස සවිස්තරාත්මකව දත්ත රැස්කර සහතික කරන ලද අයදුම්කරුවන්ගේ ලේඛණයට ප්‍රාදේශිය ලේකම්ගේ අනුමැතිය ලැබිය යුතුවේ. ඉන්පසු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන්ගේ නාම ලේඛණය පද්ධතිගත වේ.

හතරවන වන පියවර-

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් පළකර ඇති. 2019.06.20 දිනැති අංක 2128/24 දරන ගැසට් පත්‍රයේ සඳහන් තෝරාගැනීමේ නිර්ණායක සහ දර්ශක අනුව ලකුණු ලබාදීම පද්ධතිගත ක්‍රමවේදයකට අනුව සිදු වේ.එම දරිද්‍රතා ලකුණු මත සුදුසුකම් ලැබූ තැනැත්තන්ගේ නාම ලේඛනය සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අනුමැතිය මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රසිද්ධ කරනු ලැබේ.එම නාම ලේඛනය සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඔබගේ කාර්යාලයේ ප්‍රදර්ශනය කළ යුතුය.

පස්වන පියවර-

සුබසාධක ප්‍රතිලාභ පනතේ 11 (1) වගන්තිය යටතේ විරෝධතා සහ අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයක් මණ්ඩලය විසින් ජාතික පුවත්පත් වල පළ කරනු ලැබේ. එම විරෝධතා සහ අභියාචනා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබා ගන්නා අතර,මෙම පැමිණිලි සහ විරෝධතා විභාග කිරීම සඳහා සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ පනවා ඇති නියෝග අනුව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විමසා දිස්ත්‍රික් ලේකම්වරයා විසින් සුදුසු මාණ්ඩලික නිලධාරියෙකු සභාපතිවරයා වශයෙන් පත්කරන අතර සෙසු සාමාජියන් දෙදෙනා ඔබ විසින් දිස්ත්‍රික් ලේකම්වරයා වන ඉදිරිපත් කල යුතුය.එලෙස පත්වන අභියාචනා කමිටුවෙන් ඉදිරිපත් වන විරෝධතා,අභියාචනා හා පැමිණිලි විභාග කිරීමෙන් පසු සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීමට සුදුසු තැනැත්තන්ගේ නාම ලේඛනයට අලුතින් සුදුසුකම් ලැබූ තැනැත්තන්ගේ නම් ඇතුලත් කොට ප්‍රසිද්ධ කරනු ලබයි.

මෙම ක්‍රියාවලිය අවසානයේ රාජ්‍ය සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන් සහ ප්‍රතිලාභීන්ගේ සියලු තොරතුරු ඇතුලත් ජාතික දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය බලාපොරොත්තු වන අතර වාර්ෂිකව එය යාවත්කාලීන කිරීමටද කටයුතු කරනු ඇත.

කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුතුව රාජ්‍ය සුබසාධක වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ඔබගේ සහයෝගය සහ මෙහෙයවීම බෙහෙවින්ම අපේක්ෂා කරමි.

ස්තූතියි.

මෙයට,

බී.විජයරත්න
**සභාපති/කොමසාරිස්**
**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය.**